
**විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය**

**නිපුණතාව - බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි**

**නිපුණතා මට්ටම - චතුරාර්ය සත්‍ය හැඳින ධර්මය කෙරෙහි පැහැදීමෙන් කටයුතු කරයි**

**පාඩම -**16 පාඩම - චතුරාර්ය සත්‍ය



# 7 ශ්‍රේණිය

## 16 පාඩම - චතුdrරාර්ය සත්‍ය

## I - කොටස

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. බුදුරජාණන් වහන්සේගේ පළමු ධර්ම දේශනාව වනුයේ

    1. මහා මංගල සූත්‍රයයි. 2. දම්සක් පැවතුම් සූත්‍රයයි.

    3. කරණීය මෙත්ත සූත්‍රයයි. .4 රතන සූත්‍රයයි.

2. ජාති ආගම් කුල භේදයකින් තොරව සියලු සත්වයන්ට උරුම වී ඇති මූලික ගැටලුව නම්

    1. වසංගත රෝගවලට ගොදුරු වීමය 2. තම කැමති දේ නොලැබීමය

    3. ආහාර ආදිය නොලැබීමය .4 සංසාරය දුක් සහිත වීමයි

3. දුක්ඛ සමුදය ආර්ය සත්‍යයෙන් පැහැදිලි කරනුයේ

    1. දුක හට ගැනීමයි 2. දුක් සහිත බවට හේතුවයි

    3. දුක් නැති කිරීමයි .4 දුක නැති කිරීමේ මාර්ගයයි

4. බුදුවරයෙකු ලොව පහළ වෙන්නේ

    1. ආගමක් දේශනා කිරීමටයි

    2. චතුරාර්ය සත්‍ය ලොවට පැහැදිලි කිරීමටයි

    3. රට පාලනය කිරීමට අවශ්‍ය උපදෙස් දීමටයි

    .4 ලෝකයේ පැවැත්ම පිළිබඳ පැහැදිලි කිරීමටයි

5. අධික ලෙස කම් සැප විඳීමේ අන්තගාමී පිළිවෙත හැඳින්වෙන්නේ

    1. අත්ථකිලමතානුයෝගය නමිනි 2. මධ්‍යම ප්‍රතිපදාව නමිනි

    3. කාමසුඛල්ලිකානුයෝගය නමිනි 4. විභව තණ්හා නමිනි

6. තෘෂ්ණාවේ ආකාර තුනකි.එයින් පංචේන්ද්‍රියන් පිනවීමට ඇති කැමැත්ත හඳුන්වන්නේ කුමන නමින් ද?

    1. භව තණ්හා 2. කාම තණ්හා

    3. විභව තණ්හා 4. දාන තණ්හා

7. භව තණ්හා යනු

    1. පංචේන්ද්‍රියන් පිනවීමට ඇති කැමැත්තයි 2. සසර ඉපදීමට ඇති කැමැත්තයි

    3. නිවන් දැකීමට ඇති කැමැත්තයි 4. බණ ඇසීමට ඇති කැමැත්තයි

8. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සඳහන් "සම්මා දිට්ඨි" යනු

    1. නිවැරදි කල්පනාවයි 2. නිවැරදි දිවි පැවැත්මයි

    3. නිවැරදි දැකීමයි 4. නිවැරදි සිහියයි



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

9. ත්‍රිවිධ ශික්ෂාව නම්

1. බුද්ධ රත්නය,ධම්ම රත්නය හා සංඝ රත්නය යි
2. දාන,සීල හා භාවනා යි
3. සිත,කය හා වචනය යි
4. පඤ්ඤා, සීල හා සමාධි යි

10. අනුන් නැසීමෙන් වැළකීමේ කල්පනාව හඳුන්වන්නේ

1. නෙක්ඛම්ම නමිනි
2. අව්‍යාපාද නමිනි
3. අවිහිංසාව නමිනි
4. ව්‍යාපාද නමිනි

## 7 ශ්‍රේණිය

## 16 පාඩම - චතුරාර්ය සත්‍ය

## II - කොටස

1. චතුරාර්ය සත්‍ය පිළිවෙළින් ලියන්න
2. බුද්ධ කාලය වන විට පිළිගත් අන්තගාමී පිළිවෙත් දෙක නම් කරන්න
3. දුක්ඛ ආර්ය සත්‍යයේ සඳහන් වන පරිදි සත්ත්වයා දුකට පත් වන අවස්ථා සඳහන් කරන්න
4. ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳ පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න
    i. ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් කරන්න .
    ii. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සඳහන් “ සම්මා කම්මන්ත” යන්න කෙටියෙන් හඳුන්වන්න
5. චතුරාර්ය සත්‍ය දහමෙහි ඉගැන්වෙන ආකාරයට ගැටලුවක් විසඳා ගන්නා ආකාරය පැහැදිලි කරන්න



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

# 7 ශ්‍රේණිය

## 16 පාඩම - චතුරාර්ය සත්‍ය

## පිළිතුරු

## I - කොටස

1. දම්සක් පැවතුම් සූත්‍රය
2. සංසාරය දුක් සහිත වීමයි
3. දුක් සහිත බවට හේතුවයි
4. චතුරාර්ය සත්‍ය ලොවට පැහැදිලි කිරීමටයි
5. කාම සුඛල්ලිකානුයෝගය නමිනි
6. කාම තණ්හා
7. සසර ඉපදීමට ඇති කැමැත්තයි
8. නිවැරදි දැකීමයි
9. පඤ්ඤා, සීල හා සමාධි යි
10. අව්‍යාපාද නමනි

## II - කොටස

1. දුක්ඛ ආර්ය සත්‍ය , දුක්ඛ සමුදය ආර්ය සත්‍ය , දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය , දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය
2. කාමසුඛල්ලිකානුයෝගය , අත්ථකිලමතානුයෝගය
3. ඉපදීම , ජරාවට පත්වීම , මහලු වීම , රෝග පීඩාදියට පත්වීම , අප්‍රියයන් සමග එකතු වීමට සිදුවීම, මරණයට පත්වීම , ප්‍රියමනාප අයගෙන් වෙන්වීමට සිදුවීම , සිතන පතන කැමති දේ නොලැබීම යනාදියයි .
4. 
   i. සම්මා දිට්ඨි , සම්මා සංකප්ප , සම්මා වාචා , සම්මා කම්මන්ත , සම්මා ආජීව , සම්මා වායාම, සම්මා සති , සම්මා සමාධි
   ii. නිවැරදි යහපත් ක්‍රියාවල නිරත වීමයි.එනම් සතුන් මැරීම ,සොරකම් කිරීම , කම් සැප විදීම, යන කායික අකුසල්වලින් වැළකීමයි. සතුන්ට කරුණාව දක්වමින්, දුන් දේ පමණක් ගනිමින් ශිෂ්ට සම්පන්න ලෙස කම් සුව විදිමින් ජීවත් වීමයි
5. ගැටලුවේ ස්වභාවය තේරුම් ගැනීම .
   ගැටලුව පැන නැගීමට හේතු වූ කරුණු වටහා ගැනීම
   එම හේතු ඉවත් වූ විට ගැටලුව විසඳෙන බව



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල


විධිමත් හා බුද්ධිමත් ක්‍රියාමාර්ගයක් තුළින් එම හේතු ඉවත් කර ගැනීමෙන් ගැටලුවෙන් නිදහස් වීම යන අදහස් ඇති පිළිතුරු.

**විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය**

**නිපුණතාව - ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.**

**නිපුණතා මට්ටම - තමා උපමාවට ගනිමින් ජීව හිතවාදී ආකල්ප ගොඩ නඟා ගනී**

**පාඩම -17 පාඩම - වළකිමු වරදින් උපමා කොට තමන්**



# 17- පාඩම

## වළකිමු වරදින් උපමා කොට තමන්

## I - කොටස

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1. බුදුරජාණන් වහන්සේ වේළුද්වාර සූත්‍රය දේශනා කරනු ලැබුවේ
   1. ශාක්‍යකුල වංශිකයන්ට ය
   2. පස්වග මහනුන්ට ය
   3. වේළුද්වාර ග්‍රාමවාසී බ්‍රාහ්මණ ගෘහපතිවරුන්ට ය
   4. බිම්බිසාර රජතුමාට ය

2. අත්තූපනායික ධර්මය ලෙස හැඳින්වෙන්නේ
   1. ප්‍රාණඝාතයෙන් වෙන් වීමයි
   2. තමා උපමාකොට අන් අය ගැන සිතීමයි
   3. ධර්මයේ සඳහන් වන නිසා වරදින් මිදීමය
   .4 ලෝකයාට බයේ වැරදි නොකිරීමය

3. තමාටත් අනුන්ටත් මෙලොවටත් පරලොවටත් පලක් නොමැති නිෂ්පල වචන කතාකිරීම
   1. සුභාෂිත වචන ලෙස හැඳින් වේ
   2. නපුරු රළු වචන ලෙස හැඳින් වේ
   3. හිස් වචන ලෙස හැඳින් වේ
   4. අර්ථවත් වචන ලෙස හැඳින් වේ

4. අප සමාජයේ ජීවත්වන සෑම අවස්ථාවකදී ම ක්‍රියා කළ යුතු වන්නේ
   1. තමාගේ දියුණුවටම පමණක් කටයුතු කිරීමය
   2. අන් අයගේ දියුණුවම සිතා කටයුතු කිරීමය
   3. තමාගේත් අන් අයගේත් දියුණුවඋදෙසා කටයුතු කිරීමය
   4. තමාගේ ප්‍රසිද්ධිය උදෙසා කටයුතු කිරීමය

5. අදත්තාදානය ලෙස හැඳින්වෙන්නේ
   1. ප්‍රාණඝාතයයි
   2. නොදුන් දේ ගැනීමයි
   3. අයුතු ලෙස කම්සැප විඳීමයි
   4. දන් දීමයි

## 17- පාඩම

## වළකිමු වරදින් උපමා කොට තමන්

## II - කොටස

**පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

1. ත්‍රිකෝටික පාරිශුද්ධ ශීලය සරල අදහස හඳුනාගෙන එම කරුණු තුන ලියන්න
2. " සබ්බේ තසන්ති දණ්ඩස්ස " යන
    i. ධම්මපද ගාථාව ලියන්න .
    ii. එම ගාථාවේ සරල අදහස ඔබේ වචනයෙන් ලියන්න.
3. වේළුද්වාර සූත්‍රයෙන් ගත හැකි දහම් කරුණු සැලකිල්ලට ගෙන දැනට පවතින වසංගත තත්ත්වයෙන් ඔබ හා අනෙක් අය බේරා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් ලියා දක්වන්න
4. අධිපති ධර්ම නම් කරන්න.
5. සිව් වැදෑරුම් වාග් විසමාචාරය දක්වන්න



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

## 7 ශ්‍රේණිය

## 17- පාඩම - වළකිමු වරදින් උපමා කොට තමන්

### පිළිතුරු - I - කොටස

1. වේළුද්වාර ග්‍රාමවාසී බ්‍රාහ්මණ ගෘහපතිවරුන්ට ය .
2. තමා උපමා කොට අන් අය ගැන සිතීමයි .
3. හිස් වචන ලෙස හැඳින් වේ .
4. තමාගේත් අන් අයගේත් දියුණුව උදෙසා කටයුතු කිරීමයි.
5. නුදුන් දේ ගැනීමයි.

### පිළිතුරු - II - කොටස

1.
   i. තමා වරදින් වැළකීම
   ii. අන්‍යයන්ද ඉන් වැළැක්වීම
   iii. වරදින් වැළකීමේ ගුණ වර්ණනා කිරීම

2.
   i. සබ්බේ තසන්ති දණ්ඩස්ස
   සබ්බේසං ජීවිතං පියං
   අත්තානං උපමං කත්වා
   නහනෙයිය ඝාතයේ

   ii. සියල්ලෝ ම දඬුවමට බිය වෙති . සියල්ලන්ටම ජීවිතය ප්‍රිය ය .තමන් උපමා කොට අනුන් ඝාතනය නොකළ යුතුය .නොකරවිය යුතුය .

3. තමා රෝගයෙන් වැළකීම හා අන් අයට රෝගය බෝ නොවන පරිදි හැසිරීම

උදා ; මුඛ ආවරණ පැළඳීම

මීටරයක දුරස්ථභාවය පවත්වා ගැනීම

තමා රෝග ආශ්‍රිතයෙකු නම් වෙන්ව විසීම (නිරෝධායනය වීම )

තම හිතවතුන් ඒ පිළිබඳව දැනුවත් කර ඔවුන්ද රෝගයට ගොදුරු නොවන පරිදි කටයුතු කිරීමට යොමු කිරීම

4.

- අත්තාධිපති
- ලෝකාධිපති
- ධම්මාධිපති

5.

i. බොරු කීම
ii. කේලාම් කීම
iii. නපුරු වචන කතා කිරීම
iv. නිශ්ඵල වචන කතා කිරීම

සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

# විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය

**නිපුණතාව - ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.**

**නිපුණතා මට්ටම - මානව සබඳතා පවත්වා ගැනීමට ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව ක්‍රියා කරයි**

**පාඩම -18 පාඩම- තැනට ගැළපෙන ලෙසින් හැසිරෙමු.**

# 18 - පාඩම

## තැනට ගැළපෙන ලෙසින් හැසිරෙමු.

1) හිස්තැන් පුරවන්න .

   1. බුදු දහම අනුව අප අනුන් හා පවත්වන කතා බස් දෙයාකාරය . එම ආකාර දෙක නම් _______________ හා ___________________________ වේ .
   2. සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ "කියනවා" යන්න සඳහා ව්‍යවහාර වන ශාසනික වචනය වන්නේ _____________________________

2) කෙටි පිළිතුරු සපයන්න .

   1. "සුභාෂණ" යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද ?
   2. මජ්ඣිම නිකායේ අභයරාජ සූත්‍රයට අනුව අප කතා කරන වචනවල ඇතුළත් විය යුතු ප්‍රධාන අංග තුන ලියන්න.
   3. භික්ෂූන් වහන්සේ නමක් ආමන්ත්‍රණය කිරීම සඳහා භාවිත කළ හැකි ගෞරවාන්විත ආමන්ත්‍රණ ලියන්න

3) නිවැරදි ලෙස ශාසනික වචනය ගළපන්න **.**

| අදහස | ශාසනික ව්‍යවහාරය |
|---|---|
| 1. නිදාගන්නවා | වැඩ සිටිනවා |
| 2. අනුභව කරනවා | සිවුරු පොරවනවා |
| 3. කියනවා | අමදිනවා |
| 4. ඇවිදිනවා | දේශනා කරනවා |
| 5. සිටිනවා | සක්මන් කරනවා |
| 6. තේ බොනවා | සැතපෙනවා |
| 7. ඇඳුම් අඳිනවා | වළඳනවා |
| 8. අතු ගානවා | ගිලන්පස වළඳනවා |

4) කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න

තම නිවසට පැමිණි

සැම දෙන හට කුලුණෙනි

....................................................

..................................................

5) ඔබගේ නිවසට පැමිණෙන නෑදෑ හිත මිතුරන්ට ප්‍රිය වචනයෙන් සංග්‍රහ කරන්නේ කෙසේ ද?

6) යහපත් වචන කතා කිරීමෙන් අපට සැලසෙන වාසි දක්වන්න .(යහපත් ප්‍රතිපල )

7) යහපත් වචන භාවිතයේ අගය දැක්වෙන වාක්‍ය පහක් සකස් කරන්න .



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

# 18- පාඩම

## තැනට ගැළපෙන ලෙසින් හැසිරෙමු .

### පිළිතුරු - I - කොටස

1)

1. සුභාෂණ , දූර්භාෂණ
2. දේශනා කරනවා

2)

1. බොරු කීමෙන් වැළකීම , ඇත්ත කීම ,ඇත්තෙන් ඇත්ත ගළපා කීම , තහවුරු කළ හැකි කතා බහ, පිළිගත හැකි වචන භාවිතය , අනුන් නොරැවටීම,
2. කතා කරන කරුණු සත්‍ය විය යුතුය
   හේතු සාධක සහිත විය යුතුය.
   අසන්නාගේත්, කියන්නාගේත් යහපත පිණිස හේතු විය යුතුය .
3. ස්වාමින් වහන්ස , හාමුදුරුවනේ , අපේ හාමුදුරුවනේ , හාමුදුරුවන් වහන්ස ( මින් දෙකක්

3)

| | |
|---|---|
| 1. නිදාගන්නවා | වැඩ සිටිනවා |
| 2. අනුභව කරනවා | සිවුරු පොරවනවා |
| 3. කියනවා | අමදිනවා |
| 4. ඇවිදිනවා | දේශනා කරනවා |
| 5. සිටිනවා | සක්මන් කරනවා |
| 6. තේ බොනවා | සැතපෙනවා |
| 7. ඇඳුම් අඳිනවා | වළඳනවා |
| 8. අතුගානවා | ගිලන්පස වළඳනවා |

4) කතා බස් කරමිනි
අසන් තොරතුරු සුදුසු විදියෙනි

5) ආයුබෝවන් කියා පිළිගැනීම ,තෙරුවන් සරණයි කියා ආශීර්වාද කිරීම, ආ ගිය තොරතුරු විමසීම, සතුටු සාමීචියේ යෙදීම.

6) අන් අයගේ ආදර ගෞරවයට පාත්‍රවීම . අන් අය අතර ප්‍රිය වීම . අන් අයගේ උදවු උපකාර ලැබීම . ආදී වශයෙන්

7) i. ප්‍රිය වචන කතා කරමු. (සුදුසු පරිදි මෙවන් ආදර්ශපාඨ)

ii. නපුරු වචන කථා නොකරමු

iii. කරුණාවෙන් කථා කරමු ආදී වශයෙන් වාක්‍ය 5 ක් ලියන්න.



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය

නිපුණතාව - ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි

නිපුණතා මට්ටම - මහින්දාගමනයෙන් ශ්‍රී ලාංකිකයන් ලද දායාද හැඳින ඒවා ශාසනික හා සංස්කෘතික වශයෙන් ඇගයීමට ලක් කරමින් සංරක්ෂණය කරයි

පාඩම -19 පාඩම- මහින්දාගමනයෙන් අප ලත් දායද

# 19 පාඩම

## මහින්දාගමනයෙන් අප ලත් දායද

## I - කොටස

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1. අනුබුදු මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කරන ලද්දේ

   1. වෙසක් පොහෝ දිනකදීය　　2. ඇසල පොහෝ දිනකදීය

   3. පොසොන් පොහෝ දිනකදීය　　4. උඳුවප් පොහෝ දිනකදීය

2. සිව්වන ධර්ම සංගායනාව සිදු කරන ලද්දේ

   1. මාතලේ අළු විහාරයේදීය　　2. සප්ත පර්ණි ගල් ගුහා ද්වාරයේදීය

   3. පැළලුප් නුවර අශෝකාරාමයේදීය　　4. විශාලා මහා නුවර වාලුකාරාමයේදීය

3. බෞද්ධ සාහිත්‍යයේ ශාරීරික චෛත්‍යය මූලික කරගත් පුද පූජා ක්‍රමයකි .

   1. බෝධි පූජාව　　2. බුදු පිළිම වන්දනාව

   3. දළදා පූජාව　　4. දේව පූජාව

4. මහින්දාගමනයෙන් පසු මෙරට සාහිත්‍ය කෘති බුදු දහමින් පෝෂණය විය .ඒ අනුව බිහි වූ පද්‍ය සාහිත්‍ය කෘතියකි .

   1. බුත්සරණ　　2. අමාවතුර

   3. සද්ධර්ම රත්නාවලිය　　4. සසදාවත

5. උඳුවප් පුර පසළොස්වක පොහෝ දින සිදු වූ වැදගත් සිදුවීමකි .

1. මිහිඳු හිමි ලංකාවට වැඩම කිරීම　　2. සංඝමිත්තා තෙරණිය ලංකාවට වැඩම කිරීම

3. බුදුරජාණන් වහන්සේ මංගල ධර්ම දේශනාව පැවැත්වීම　　4. බෝසතාණන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කිරීම




සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල

**19 පාඩම**

**මහින්දාගමනයෙන් අප ලත් දායද**

**II - කොටස**

**කෙටි පිළිතුරු සපයන්න.**

1. මිහිඳු මහාරහතන් වහන්සේ  සමග ලංකාවට වැඩම කළ පිරිස නම් කරන්න
2. මහින්දාගමනයට පෙර ලක්දිව පැවති ඇදහිලි හා විශ්වාස 2ක් ලියන්න
3. ත්‍රිවිධ චෛත්‍ය නම් කරන්න
4. බුදු දහම ඇසුරින්  පෝෂිත ගද්‍ය සාහිත්‍ය කෘති හතරක් ලියන්න
5. මහින්දාගමනයෙන්  අප ලත් දායාද යන මැයෙන් ලිපියක් සකස් කරන්න

## 19 පාඩම

## මහින්දාගමනයෙන් අප ලත් දායද

## පිළිතුරු - කොටස I

1. පොසොන් පුර පසළොස්වක පොහෝ දිනකදීය .
2. මාතලේ අළු විහාරයේදීය .
3. දළඳා පූජාව
4. සසදාවත
5. සංඝමිත්තා තෙරණිය ලංකාවට වැඩම කිරීම .

## පිළිතුරු - කොටස II

1. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල මහ රහතන් වහන්සේ, සුමන සාමණේර වහන්සේ, භණ්ඩුක උපාසක
2. මළවුන් ඇදහීම, දෙවියන්ට පුද පූජා පැවැත්වීම , ගස් ගල්වලට වැඳුම් පිදුම් කිරීම .
3. ශාරීරික චෛත්‍ය, පාරිභෝගික චෛත්‍ය , උද්දේසික චෛත්‍ය
4. සද්ධර්ම රත්නාවලිය , බුත්සරණ , අමාවතුර , පන්සිය පනස් ජාතක පොත
5. බුදු දහමින් පෝෂණය වූ, ආගමික සංස්කෘතික දායාද පිළිබඳ සුදුසු පරිදි දක්වා තිබීම

විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය

නිපුණතාව - බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි

නිපුණතා මට්ටම - ධන පරිහරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් අනුගමනය කරයි

පාඩම -20 පාඩම- ධන පරිභෝජනයට අදාළ බොදු මග

# 20 පාඩම

## ධන පරිභෝජනයට අදාළ බොදු මග

**පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

1. කවිය කියවා ඉන් ලබා දෙන ආදර්ශ තුනක් ලියන්න

| | |
|---|---|
| මේ ගසේ බොහෝ පැණි දොඩම් | තිබේ |
| පැහිල ඉදිල බිමට නැමිල බර වෙලා | අතු |
| නංගිටයි මටයි ගෙඩි දෙකක් | ඇති |
| වැඩිය කඩන නරක ළමයි හෙම නොවේ | අපි |

2. පාඩමේ සඳහන් ආනන්ද හිමියන්ගේ කතාවෙන් ඔබට ගත හැකි ආදර්ශ ලියන්න .
3. ධන පරිහරණයේදී සමජීවිකතාව බෙහෙවින් වැදගත් වේ. මෙහි සමජීවිකතාව යන්නෙන් අදහස්

   වන්නේ කුමක් ද?

4. ධනය උපයන සියල්ල වැය කරන්නන් බුදුදහමේ හඳුන්වා ඇත්තේ කෙසේ ද?
5. බුදුදහමේ " අජද්ධුමාරිකයන්" ලෙස හඳුන්වන්නේ කවුරුන් ද ?
6. බුදුදහමට අනුව ධනය කොටස් හතරකට බෙදා පරිහරණය කිරීමට උපදෙස් ලබා දී ඇත . එය

   පැහැදිලි කරන්න.

7. සීමිත සම්පත් අරපිරිමැස්මෙන් සැලසුම් සහගතව පරිහරණය කරන ආකාරය උදාහරණයන් මගින් පැහැදිලි කරන්න .

## 20 පාඩම

## ධන පරිභෝජනයට අදාළ බොදු මග

### පිළිතුරු

1.

- සම්පත් පරිහරණය
- අරපිරිමැස්ම
- සම්පත් සුරක්ෂිතතාව
- සම්පත් කළමනාකරණය

2.

- වැඩි කලක් භාණ්ඩ අරපිරිමැස්මෙන් භාවිත කිරීම .
- උපරිම කාලයක් භාවිත කිරීම .
- භාණ්ඩ ප්‍රයෝජනවත් වැඩ සඳහා භාවිත කිරීම ආදී වශයෙන්

3. සමජීවිකතාව යනු - පුද්ගලයෙකුගේ ආදායමට සරිලන පරිදි වියදම සැලසුම් කිරීම හා ක්‍රියාවට නැංවීමයි .
4. උදුම්බරඛාදකයින්
5. නොකා නොබී ධනය උපයා තබා මිය යන්නන් (මසුරු අය)
6. අවශ්‍ය සම්පත් අවශ්‍ය ප්‍රමාණයට උපයා ගෙන අනාගත ප්‍රයෝජනයට ප්‍රමාණවත් පරිදි තැන්පත් කර ගැනීමට කටයුතු කිරීම.
7. උපයන ධනය 4/1 - පරිභෝජනයට

- 4/2 ආයෝජනයට

4/1 - ඉතිරි කිරිමට පුරුදු වීම


යනාදිය සුදුසු පරිදි කරුණු දැක්වීම

**විෂයය - බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය**

**නිපුණතාව - නිර්වාණය අරමුණු කොට ගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි**

**නිපුණතා මට්ටම - නිවැරදි දැක්මකින් හා මනා හැඟීමකින් යුතු ව පුණ්‍ය ක්‍රියාවන් හි යෙදෙයි**

**පාඩම -21 පාඩම- දෙලොව වැඩ සලසන පින් කිරියවත්**



## 21 පාඩම

## දෙලොව වැඩ සලසන පින් කිරියවත්

**කෙටි පිළිතුරු ලියන්න**

1. සිංහලයේ දෙවන මහා කාව්‍ය ලෙස සැලකෙන ග්‍රන්ථය කුමක්ද ?

2. එම ග්‍රන්ථය රචනා කරන ලද හිමියන්ගේ නම ලියන්න .

3. එම කෘතියට වස්තු බීජය වූ ජාතක කථාවේ නම ලියන්න.

4. කාව්‍යශේඛරයේ දොළොස් පින් කිරියවත් සඳහන් වන කවි දෙක හඳුනාගෙන ලියන්න.

5. සම්මා කම්මන්ත , සම්මා වාචා , සම්මා ආජීව යන්න කෙටියෙන් හඳුන්වන්න .

6. දස වැදෑරුම් දානය නම් කරන්න.

7. දොළොස් පින් කිරියවත්හි අපචායන කුසලය ලෙස හැඳින්වෙන්නේ කුමක්ද ?

8. දොළොස් පින් කිරියවත්හි කළ කුසල් සිහිකිරීමේ කුසලය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

9. යහපත් දරුවෙකු ලෙස ඔබට කළ හැකි වතාවත් කිහිපයක් දක්වන්න.

10. ඔබ නිවෙස් පරිසරයේ සිට ප්‍රායෝගිකව ඔබට සිදු කළ හැකි පින් කිරියවත් කිහිපයක් පැහැදිලි කරන්න.

## 21 පාඩම

## දෙලොව වැඩ සලසන පින් කිරියවත්

### පිළිතුරු

1. කාව්‍යශේඛරය
2. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්
3. සත්තුභත්ත ජාතකය
4. දන් සිල් භාවනා - පින් දෙනු අනුමෝදනා

   බණසනු දෙසනා - පිදිය යුත්තන් පුදනු සමනා

   කරනුද වතාවත් - පින්කරු ගුණ වැනීමත්

   සරණ සිහිවීමත් - දොළොස් පින් දැන කරව යාපත්

5. සම්මා කම්මන්ත - කයින් සිදුවන වැරදි ක්‍රියා තුනෙන් වැළකීම .(ප්‍රාණඝාතයෙන් වෙන්වීම, අදත්තාදානයෙන් වෙන්වීම , වැරදි කාම සේවනයෙන් වැළකීම )
   සම්මා වාචා - වචනයෙන් සිදුවන වැරදි හතරෙන් වෙන්වීම .(බොරු කීමෙන් , පරුෂ වචන කීමෙන් හිස් වචන කීමෙන් , කේලාම් කීමෙන් වැළකීම )
   සම්මා ආජීව - නොකළ යුතු වෙළඳාම් පහෙන් වෙන්වීම. (සත්ත්ව වෙළඳාම , අවි ආයුධ වෙළඳාම , මත්පැන් වෙළඳාම , වසවිස වෙළඳාම , මාංශ වෙළඳාම )
6. දස වැදැරුම් දානය -
   - බත්
   - පැන්
   - වස්ත්‍ර
   - ඇඳ පුටු මේස
   - මල්
   - සුවඳ
   - විලේපන ද්‍රව්‍ය
   - තෙල්
   - ආවාස පහසුකම්
   - වාහන
7. ගුණවත් කමින් යුතු යතිවරුන්ට, කුල පරම්පරාවේ වැඩිහිටි අයට වැඳුම් පිදුම් කිරීම
8. අනුස්සති කුසලය නමිනි
9. පින්කම් කිරීමේදී කළ යුතු වතාවත් - මල් අසුන් පිරිසිදු කිරීම, මළු පෙත් ඇමදීම, පිරිසිදු කළ යුතු ස්ථාන පිරිසිදු කිරීම, ගිලනුන්ට උපස්ථාන කිරීම - ආහාර දීම, නෑවීම, බෙහෙත් සැපයීම
10. පංච සීල ප්‍රතිපත්තිය (පන්සිල් සුරැකීම) හැකි සෑම විටම භාවනා කිරීම, දන්දීම, පිදිය යුත්තන් පිදීම, (ගුරු,දෙගුරුන් පිදීම ) බණ ඇසීම ආදිය



සැකසුම - ලලිත් වීරසිංහ
ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය - පිළියන්දල